දූරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832

ලේකම් / செயலாளர் / Secretary } 2784811

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50
Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ……………………………………

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education**

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாய' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. } **ED/05/93/03/02**
අධ්‍යාපන ඵලදායිතා මෙහෙයුම් ඒකකය

දිනය / திகதி / Date } 2013.- 3 - 27

**චක්‍රලේඛ අංකය :- 2013/03**

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලු ම කොට්ඨාස භාර නි.අ.අ./ ස.අ.අ.වරුන්,

සියලු ම විදුහල්පතිවරුන්

## <u>ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම</u>

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ වාර්ෂික ව ඇති වන්නා වූ ප්‍රමාණාත්මක වර්ධනයට සාපේක්ෂ ව ගුණාත්මක තත්ත්වය ද තව දුරටත් වර්ධනය කිරීමේ ක්‍රියාදාමයේ එක් වැදගත් පියවරක් ලෙස ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීම හඳුන්වා දිය හැකි ය. සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ වන්නා වූ සියලු ම දෙපාර්තමේන්තු, ආයතන, කාර්යාල හා පාසල්වලින් සපයනු ලබන සේවාවන්ගේ ප්‍රමිතිය උසස් කිරීම මෙමඟින් අපේක්ෂා කරනු ලැබේ. පවතින සම්පත් ප්‍රශස්ත ලෙස යොදාගෙන කාර්යක්ෂමතාව ඉහළ තලයකට ගෙන ඒම සඳහා ක්‍රියාත්මක වන්නා වූ ක්‍රමවේදයන්ගේ නූතන ප්‍රවණතාවක් ලෙස ඵලදායිතා සංකල්පය අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දිය හැකි ය. මෙමඟින් වඩාත් ගුණාත්මක වූ සේවාවක් සැපයිය හැකි වන අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීමක් ලබා දීම මෙම චක්‍රලේඛය මඟින් අපේක්ෂා කෙරේ.

## 01. හැඳින්වීම

"ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන" ක්‍රියාත්මක වීම අමාත්‍යාංශය තුළ හා ඇතැම් පාසල්වල දැනටමත් ආරම්භ කර ඇති අතර තව දුරටත් ඊට අනුබද්ධ අනෙකුත් ආයතන හා සියලු ම පාසල්වල ක්‍රමවත් ව ක්‍රියාත්මක කිරීම මඟින් යහපත් අධ්‍යාපන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා සුදුසු සැලසුම් ක්‍රියාත්මක කිරීමට දැනට කටයුතු කෙරෙමින් පවතී.

මෙම වැඩසටහන අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කිරීමේ මූලික පියවරක් වශයෙන් **"අධ්‍යාපන ඵලදායිතා මෙහෙයුම් ඒකකයක්"** 2012-10-03 දින පිහිටුවන ලද අතර ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ඵලදායිතා තරගය සඳහා ද 2013 සිට අප අමාත්‍යාංශය ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත. මෙම ක්‍රියාවලිය පළාත් අධ්‍යාපන කාර්යාල, කලාප අධ්‍යාපන කාර්යාල, කොට්ඨාස අධ්‍යාපන කාර්යාල හා පාසල් දක්වා ම ක්‍රමවත් ව ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කෙරේ. එසේ ඵලදායිතා වැඩසටහන අවශ්‍ය ම වැඩ පිළිවෙළක් ලෙස ක්‍රියාත්මක කිරීමෙන් සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පවත්නා ක්‍රියාත්මක ගැටලු අවම කර ගනිමින් වඩාත් යහපත් හා කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් මහජනයා වෙත ලබා දීම මෙමඟින් බලාපොරොත්තු වේ.

## 02. ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහනේ අරමුණු

I. අධ්‍යාපන අමාත්‍යාංශය, ඊට අනුබද්ධ සියලු ම ආයතන, ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු, අධ්‍යාපන කාර්යාල සහ පාසල්වල භෞතික පරිසරය ඵලදායි වන අයුරින් සැකසීම.

II. එම ආයතනවලින් සපයනු ලබන සේවාවන්ගේ විනිවිදභාවය ඇති කිරීම හා ඵලදායිතාවද ඉහළ තලයකට ගෙන ඒම.

III. ආයතනික නිලධාරීන් හා පාසලේ ප්‍රතිලාභීන් තුළ ඵලදායිතා ආකල්ප වර්ධනය කිරීම.

IV. ආයතනයේ හා පාසලේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලි ක්‍රමවත් කිරීම හා සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝගී කර ගනිමින් නාස්තිය අවම කිරීමේ ක්‍රමවේද හරහා කාර්යක්ෂමතාවද ඉහළ නැංවීම.

V. පුළුල් පරාසයක් තුළ දරුවන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමත්, පාසල් ප්‍රජාවගේ අවශ්‍යතාවලට වඩා සංවේදී වීමත් , පාසලේ ක්‍රියාකාරිත්වයේ පාරදෘශ්‍යතාව වැඩි කිරීමත් මෙමඟින් තව දුරටත් අපේක්ෂා කෙරේ.

VI. අධ්‍යාපන අමාත්‍යාංශය මෙන් ම ඊට අනුබද්ධ සියලු ම දෙපාර්තමේන්තු හා ආයතන මෙන් ම පළාත්, කලාප හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාල ද සියලු ම පාසල් ද ඵලදායිතා තරගය සඳහා ඉදිරිපත් කිරීම.

## 03. ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා ව්‍යාප්ත කිරීම

ඵලදායිතා සංකල්පය අනුව අමාත්‍යාංශ පරිශ්‍රය සැකසීම මෙන් ම දෙනු ලබන සේවාවන්ගේ තත්ත්වයද ඵලදායී අයුරින් පවත්වාගෙන යාමේ ක්‍රමවේද මේ වන විටත් අමාත්‍යාංශය තුළ ක්‍රියාවට නැංවෙමින් පවතී. ඊට අමතර ව අප අමාත්‍යාංශයට අනුබද්ධ ඉහත සඳහන් කළ ආයතන හා පාසල් තුළ ද මෙම ක්‍රියාවලිය ස්ථාපනය කිරීම සඳහා සුදුසු මඟ පෙන්වීමක් මෙමගින් ඉදිරිපත් කෙරේ. මෙම වැඩසටහන සෑම ආයතනයක් තුළ ම ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය කරුණක් වන අතර සියලු ම ආයතන ප්‍රධානීන් ඍජු ව ම ඒ හා සම්බන්ධ විය යුතු ය.

### 03.1 ඵලදායිතා සංකල්පය පිළිබඳ දැනුම්වත් කිරීම

ඵලදායිතා සංකල්පය පිළිබඳ අත්දැකීම් හා දැනුමක් ඇති දේශකයෙකු හා සම්බන්ධ වී ආයතනය තුළ මේ පිළිබඳ ව මූලික ව දැනුම්වත් විය යුතු පුද්ගලයන් සහභාගි කරවා දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පැවැත්විය යුතු ය. ඔවුන් හරහා ආයතනයේ හෝ පාසලේ සියලු ම ප්‍රතිලාභීන් හා කාර්ය මණ්ඩලය ක්‍රමවත් ව දැනුම්වත් කිරීමේ වැඩපිළිවෙළක් ද සංවිධානය විය යුතු ය. ඵලදායිතා සංකල්පය සමස්ත ආයතනය හා පාසල තුළ ම නිසි අයුරින් ක්‍රියාත්මක වීමේ දී මෙය ඉතා වැදගත් වේ.

### 03.2 ඵලදායිතා කව පිහිටුවීම

ආයතනයක හෝ පාසලක හෝ ඍත්ත්ව කව කිහිපයක් පිහිටුවිය හැක. ඒවා එක් එක් ක්‍රියාවලිය හෝ එක් එක් අංශය ආදී වශයෙන් එකී කාර්යයන් සාර්ථක කර ගැනීමට කුඩා කණ්ඩායම් ලෙස ගොනු විය හැක. ඵලදායිතා කව පිහිටුවීම පිළිබඳ වැඩි විස්තර මේ සමඟ නිකුත් කර ඇති පොත් පිංචේ සඳහන් වේ.

### 03.3 ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම

සෑම ආයතනයක ම ප්‍රධානියා ප්‍රධාන ඵලදායිතා ප්‍රවර්ධන නිලධාරී ලෙස කටයුතු කළ යුතු අතර වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ඵලදායිතා සම්බන්ධීකරණ නිලධාරී ලෙස පත්කර ගත යුතු ය. සියලු ම ප්‍රගති සමාලෝචන වාර්තා අඛණ්ඩ ව පවත්වා ගැනීම හා අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය ඵලදායිතා සම්බන්ධීකරණ නිලධාරී හරහා සිදු විය යුතු ය.

කව නායකයන්ගේ ප්‍රධානත්වයෙන් ඵලදායිතා කව රැස්වීම් පැවැත්විය යුතු අතර එහි දී තම ආයතනයේ හෝ පාසලේ භෞතික පරිසරය මෙන් ම සිදු කරනු ලබන සේවාවන්ගේ ඵලදායිතාව ඉහළ මට්ටමකට ගෙන ඒමට අවශ්‍ය වන කාර්යයන් හා ක්ෂේත්‍ර හඳුනා ගත යුතු අතර අපේක්ෂිත

ප්‍රතිඵල රාමුවක් ද සකස් කළ යුතු ය. තව ද ඒ සඳහා කාල රාමුවක් ද සකස් කර එය ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ.

### 03.4 ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීම

කාල රාමුවට අනුව ඵලදායිතා සංකල්පයේ කාර්යයන් ආරම්භ කිරීම හා වැඩිදියුණු කිරීම ද එම ක්‍රියාවලිවල ප්‍රගති වාර්තා පවත්වා ගෙන යාම ද අත්‍යවශ්‍ය කරුණකි.

### 03.5 ඵලදායිතා තරගවලට ඉදිරිපත් කිරීම

දැනටමත් පාසල් මට්ටමින් ඉතා සුළු ප්‍රතිශතයක් ඵලදායිතා තරග සඳහා ඉදිරිපත් වී ඇති අතර දිවයිනේ සියලු ම පාසල් හා අධ්‍යාපන පද්ධතියට අදාළ සියලු ම ආයතන ඵලදායිතා තරග සඳහා සූදානම් වීම ඉතා වැදගත් වේ.

## 04. ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා මාර්ගෝපදේශකත්වයක් ලබා දීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිහිටුවා ඇති අධ්‍යාපන ඵලදායිතා මෙහෙයුම් ඒකකය මඟින් මෙම ක්‍රියාවලිය සඳහා මූලික මාර්ගෝපදේශකත්වය ලබා දෙන අතර ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් ද අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශකත්වය ලබා ගත හැකි ය. මූලික ව ම පාසල්වල ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ මඟ පෙන්වීමක් ලෙස " අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ප්‍රවේශයක් " මැයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සකස් කරන ලද පොත් පිංචක් මේ සමඟ ලැබීමට සලස්වා ඇත. එහි සඳහන් ක්‍රමවේද තම පාසලට හා ආයතනයට ගැළපෙන ආකාරයට වඩාත් නිර්මාණශීලී ව යොදා ගැනීම අපේක්ෂා කෙරේ. ඒ මඟින් ආයතනික පරිසරයේ ක්‍රමවත් බව හා සපයන සේවාවන්ගේ ගුණාත්මක බව කැපී පෙනෙන ලෙස ඉහළ මට්ටමක් කරා වෙනස් විය යුතු ය.

## 05. වැඩසටහන අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචනය

ඵලදායිතා කවවල ක්‍රියාකාරිත්වය නිසි අයුරින් සිදු විය යුතු අතර රැස්වීම් වාර්තා හා ප්‍රගති සමාලෝචන වාර්තා නිසි පරිදි පවත්වා ගෙන යා යුතු ය. කවවල ක්‍රියාකාරිත්වය හා ආයතනයේ ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක වීම ප්‍රධාන ඵලදායිතා ප්‍රවර්ධන නිලධාරී හා ඵලදායිතා සම්බන්ධීකරණ නිලධාරී විසින් අධීක්ෂණය කළ යුතු ය. කවවල ප්‍රගති වාර්තා අවශ්‍ය වූ විට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට ඵලදායිතා සම්බන්ධීකරණ නිලධාරී වගබලා ගත යුතු ය. ඵලදායිතා කව රැස්වීම් හා අධීක්ෂණ කටයුතුවල ප්‍රතිඵලය විය යුත්තේ නිරන්තරයෙන් වැඩිදියුණු වන ක්‍රමවේද ආයතනය තුළ ගොඩනඟා ගැනීමයි.

## 06. ඉදිරි වැඩ පිළිවෙළ

මුළු දිවයින පුරා ම ඇති සියලු ම පාසල්වල හා අනෙකුත් සියලු ම ආයතනවල ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කර, සමස්ත අධ්‍යාපන පද්ධතිය ම ඵලදායී කරවීම සඳහා ඉදිරි වැඩපිළිවෙළ සකස් කළ යුතු ය. ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීමට ආයතනවල හා පාසල්වල සාධන මට්ටම් අනුව ඒවා ශ්‍රේණිගත කිරීම ද අපේක්ෂා කෙරේ.

දැනටමත් මෙම වැඩසටහන ඔබ ආයතනයේ හෝ පාසලේ සාර්ථක ව ක්‍රියාත්මක කර ගෙන යන්නේ නම් එය අගය කරන අතර අඛණ්ඩ ව **ඵලදායිතා සංකල්පය** සමස්ත පාසල් පද්ධතිය පුරා ම ක්‍රමවත් ව පවත්වා ගෙන යාම අත්‍යවශ්‍ය බව නැවතත් අවධාරණය කරමි. එහි දී ඵලදායිතා සංකල්පය කෙරෙහි දැයේ දරුවන්ගේ අවධානය හා අවබෝධය පුළුල් කරවීම අත්‍යවශ්‍ය වේ.

ඵලදායිතා සංකල්පය හා බද්ධ වීම මඟින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මක පිබිදීමක් ඇති වී සෞභාග්‍යවත් රටක් බිහි කිරීම මඟින් " දැනුම කේන්ද්‍රීය සමාජයක් " තුළින් ගොඩනැගෙන " ආසියාවේ ආශ්චර්ය ය " යන දැක්ම කරා සමස්ත පද්ධතිය මෙහෙයවීම සඳහා දායකත්වයක් ලැබෙන අයුරින් සියලු ම නිලධාරීන් කටයුතු කළ යුතු ය.

**එස්.එම්. ගෝඨාභය ජයරත්න**
අධ්‍යාපන ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :-

01. ජනාධිපති ලේකම්
02. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
03. සියලු ම අතිරේක ලේකම්වරුන්
04. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
05. විභාග කොමසාරිස් ජනරාල්
06. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
07. විද්‍යාපීඨ කොමසාරිස්
08. පිරිවෙන් අධ්‍යක්ෂ